කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

2014 වර්ෂයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාව

1. හැඳින්වීම 4

1.1 පසුබිම 4

1.2 කාර්යයන් 4

1.3 ආයතනික ව්‍යුහය 4

1.4 ප්‍රධාන අංශයන්හි වගකීම් 5

2. කාර්යසාධනය 7

2.1 කාලගුණ විද්‍යා දත්ත ජාලය 7

2.1.1.කාලගුණ විද්‍යා නිරීක්ෂණ 7

2.1.1.1. භූතල නිරීක්ෂණය........ 7

2.1.1.1.1. සංක්ෂිප්ත කාලගුණික තොරතුරු........ 7

2.1.1.1.2. වර්ෂාපතන දත්ත........ 7

2.1.1.1.3. කෘෂිකාලගුණ තොරතුරු........ 8

2.1.1.2. ඉහළ වායු ගෝලීය නිරීක්ෂණ........ 8

2.1.2. දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය 9

2.1.3.දත්ත අලෙවි කිරීම 9

2.2.මහජනතාවට විවිධ ආයතනයන්ට, විවිධ කර්මාන්තයන්ට අදාල ප්‍රජාවට සහ ලෝක කාළගුණ නිරීක්ෂණ ජාලයන්ට තොරතුරු ලබා දීම. 9

2.2.1මහජනතාවට දෛනිකව ලබාදෙන තොරතුරු........ 9

2.2.2.ලෝක නිරීක්ෂණ ජාලයන්ට දත්ත ලබාදීම 10

2.2.3.විවිධ ආයතනයන්ට හා විවිධ කර්මාන්තයන්ට අදාළ ප්‍රජාවට ලබාදෙන තොරතුරු........ 10

2.3. ගගන කාලගුණ විද්‍යා තොරතුරු ගුවන් සේවා වෙත ලබා දීම සහ නාවුක කාර්යයන් සඳහා සේවා ලබා දීම 10

2.3.1.ගගන කාලගුණ විද්‍යා තොරතුරු ගුවන් සේවා වෙත ලබා දීම........ 10

2.3.1.1 කටුනායක ගුවන් තොටුපල..........10

2.3.1.2. මත්තල ගුවන් තොටුපල..........10

2.3.1.3. රත්මලාන ගුවන් තොටුපල..........11

2.3.2.නාවුක කාර්යයන් සඳහා සේවා ලබා දීම **11**

2.3.2.1. නාවුක කටයුතු සඳහා දිවයින අවට මුහුදු ප්ර.දේශයේ කාලගුණ වාර්තාව (Shipping Report)..........11

2.3.2.2. අන්තර්ජාතික මුහුදු ප්ර.දේශයේ කාලගුණ වාර්තාව (Fleet Forecast)..........11

2.4.සුනාමි හා අයහපත් කාලගුණ තත්ව පිළිබඳව පූර්ව අනතුරු ඇගවම් හා උපදෙස් ලබාදීම 12

2.4.1.සුනාමි අනතුරු ඇගවීම..........**12**

2.4.2.අයහපත් කාලගුණ තත්ව නිවේදන..........**12**

2.5.මහජනතාව දැනුම්වත් කිරිම **12**

2.5.1.මහජනතාව දැනුම්වත් කිරිම වැඩ සටහන් **12**

2.5.1.1. ප්‍රධාන කාර්යාලය නැරඹීමට පැමිණෙන්නන්..........12

2.5.1.2. දැනුම්වත් කිරීමේ වැඩසටහන්..........13

2.5.1.3. පැවැත්වූ සම්මන්ත්‍රණ/ වැඩ මුළු..........14

2.5.1.3.1. ලෝක කාලගුණ විද්‍යා දිනය..........14

2.5.1.3.2. මෝසම් කතිකාවත..........14

2.5.1.4. දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගිත්වය..........14

2.5.2.කාලගුණ විද්‍යා උපාංග හා උපකරණ **14**

2.5.2.1. උපකරණ අංශය..........14

2.5.2.2. ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශය..........15

2.6. පර්යේෂණ..........15

2.7. තාරකා විද්‍යාව ආශ්‍රිත සීමිත සේවා සැපයීම 16

2.8. දෙපාර්තමේන්තු සංවර්ධන කාර්යයන් 16

2.8.1. සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි..........16

2.8.2. පැවත් වූ පුහුණු වැඩ සටහන් හා සම්මන්ත්‍රණ..........16

2.9. සහභාගී වූ රැස්වීම්/ පුහුණු/සම්මන්ත්‍රණ /වැඩමුළු..........16

2.9.1. විදේශීය සංචාර (රැස්වීම්/ පුහුණු/සම්මන්ත්‍රණ /වැඩමුළු)........16

2.9.2. දේශීය පුහුණු........20

3. පාලන හා මූල්‍ය අංශයේ කාර්ය සාධනය........20

3.1. පාලන අංශය........20

3.1.1. බඳවා ගැනීම්/පුරප්පාඩු සම්පූර්ණ කිරීම........20

3.1.2. විශ්‍රාම ගැන්වීම /සේවයෙන් ඉවත් වීම/මුදා හැරීම/තනතුර අතහැර යාම/මිය යාම........21

3.1.3. විශ්‍රාමික නිලධාරින් නැවත සේවයේ යෙදවීම........21

3.1.4. අදාළ කාර්යක්ශමතා කඩඉම් පරීක්ෂණ සහ දෙපාර්තමේන්තු පරීක්ෂණ පැවැත්වීම........21

3.1.5. ගර්හිත භාණ්ඩ වෙන්දේසිය........21

3.1.6. ඉදි කිරීම් කටයුතු........21

3.2. මූල්‍ය අංශය **........22**

3.2.1 ආදායම්........22

4. කෘතඥතාව........26

1. හැඳින්වීම

1.1 පසුබිම

වර්ෂ 1867 දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ විධිමත්ව කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු ඇරඹුන අතර කාලගුණ විද්‍යාත්මක කටයුතු සඳහා වෙනම අංශයක් වශයෙන් 1909 දී කොළඹ නිරීක්ෂණාගාරය ලෙස වර්තමාන පරිශ්‍රයෙහි ස්ථාපනය කරන ලදි. කාලගුණික හා දේශගුණික සේවා ලබාදීමේ මූලික අරමුණ ඇතිව එම කොළඹ නිරීක්ෂණාගාරය 1948 දී ස්වාධීන දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී. වර්තමානයේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු කාර්යයන්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශ විෂයපථය යටතේ පවත්වාගෙන යනු ලබයි.

1.2 කාර්යයන්

කාලගුණ විද්‍යාව හා දේශගුණ විද්‍යාව ආශ්‍රිත සේවා සැපයීමේ රජයේ ව්‍යවස්ථාපිත ආයතනය වශයෙන් පහත සඳහන් ප්‍රධාන කාර්යයන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබයි.

1. ජාත්‍යන්තර සම්මත ප්‍රමිතීන්ට අනුකූලව කාලගුණික පරාමිතීන් නිරීක්ෂණය.
2. බලයලත් ජාතික ආයතනය වශයෙන් කාලගුණික හා දේශගුණික සේවා සැපයීම.
3. සුනාමි හා අයහපත් කාලගුණ තත්ත්ව පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් හා උපදේශන සේවා ලබා දීම.
4. ජාතික හා අන්තර්ජාතික ගුවන් සේවා වෙත අවශ්‍ය වන කාලගුණ විද්‍යාත්මක සේවාවන් ලබා දීම.
5. දේශගුණ විද්‍යාත්මක දත්ත පද්ධති නඩත්තු කිරීම හා පවත්වා ගෙන යාම.
6. කාලගුණ විද්‍යාව හා ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යයනයන් හා පර්යේෂණයන් දිරිමත් කිරීම.
7. මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම හා ඒ සඳහා දායක වීම.
8. තාරකා විද්‍යාව හා භූ චුම්බකත්වය ආශ්‍රිත සීමිත සේවාවන් සැපයීම.

1.3 ආයතනික ව්‍යුහය

අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු යටතේ පාලනය වන දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂවරු පස් දෙනෙකු යටතේ පාලනය වන ප්‍රධාන අංශ පහ (05) කින්ද ඊට අනුබද්ධිත උප අංශ එකොළහ (11) කින්ද සමන්විත වේ.

දත්ත ලබා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයට අමතරව ප්‍රාදේශීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන විසිදෙකක් (22) ද, ස්වයංක්‍රීය කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථාන 36 ක්ද, කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 35 ක්ද, වර්ෂාපතන මධ්‍යස්ථාන 400 ක්ද දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබයි.

1.4 ප්‍රධාන අංශයන්හි වගකීම්

අනු අංකය	ප්‍රධාන අංශය	උප අංශය	වගකීම්
1.	නිරීක්ෂණ ජාල හා උපකරණ	1.1 උපකරණ අංශය	කාලගුණ විද්‍යා උපකරණ අංක ශෝධනය හා නඩත්තුව, වඩු සහ කාර්මික කාර්යයන් හා ප්‍රදර්ශන කටයුතු වලට සහය වීම
		1.2 විදුලි හා විද්‍යුත් නඩත්තු අංශය	විදුලි හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම, ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය සහ චන්ද්‍රිකා දත්ත ලබාගැනීමේ පද්ධතිය නඩත්තු කිරීම
		1.3 රේඩාර්/ රේඩියෝසොන්ඩ් අංශය	ඉහළ වායුගෝල නිරීක්ෂණ, එම දත්ත සංරක්ෂණය, දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණෙන අය සඳහා දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම
		1.4 ප්‍රාදේශීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	සෑම පැය 3කට වරක්ම භූතල මට්ටමේ කාලගුණ විද්‍යා නිරීක්ෂණ ලබා ගැනීම. නිරන්තර කාලගුණ තත්වය නිරීක්ෂණය ඉහළ වායුගෝලීය නිරීක්ෂණ සෑම පැය 06 කට වරක් ලබා ගැනීම.(ඉහළ වායුගෝලීය නිරීක්ෂණ මධ්‍යස්ථාන)
2.	දත්ත සැකසුම් හා සංරක්ෂණ	2.1 දත්ත අංශය	අඛන්ඩව දත්ත සටහන් කෙරෙන උපකරණ වල දත්ත තත්ත්ව පාලනය හා සංරක්ෂණය.
		2.2 දේශගුණ විද්‍යා අංශය	ප්‍රාදේශීය මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා කළමනාකරණය, කාලගුණ විද්‍යා දත්ත තත්ත්ව පාලනය හා සංරක්ෂණය
		2.3 ජල කාලගුණ විද්‍යා අංශය	වර්ෂාපතන මධ්‍යස්ථාන සම්බන්ධීකරණය, දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය
		2.4 කෘෂි කාලගුණ විද්‍යා අංශය	කෘෂි කාලගුණ විද්‍යා ජාලය කලමනාකරණය සහ දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය
		2.5 පරිගණක අංශය	විද්‍යුත් ආකාරයෙන් දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය, දේශගුණ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම ,දත්ත බාහිර පාර්ශවයන් සඳහා නිකුත් කිරීම
		2.6 පුස්තකාලය	පුස්තකාලය

		2.7 ලේඛණාගාරය	දත්ත සහ තොරතුරු වලට අදාල මුද්‍රිත ලේඛණ සංරක්ෂණය
3.	පුරෝකථන හා තීරණ උපකාරක	3.1 ජාතික කාලගුණ විද්‍යා හා පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානය	කාලගුණ විද්‍යා දත්ත නැවත පිළියෙළ කර විශ්ලේෂණය කිරීම , කාලගුණ අනාවැකි නිකුත් කිරීම සහ සම්ප්‍රේෂණය, සුනාමි සහ කාලගුණ ව්‍යසන සම්බන්දව ජාතික පූර්ව අනතුරු දැනුම්දීමේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම
		3.2 සන්නිවේදන අංශය	කාලගුණ විද්‍යා දත්ත /නිරීක්ෂණ හුව මාරු කර ගැනීම, කාලගුණ විද්‍යා අනාවැකි හා අනතුරු ඇඟවීම් සම්ප්‍රේශණය
		3.3 ගුවන් තොටුපළ කාලගුණ විද්‍යා කාර්යාල	ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සහ ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO) ට අනුකූලව ගගන කාලගුණ විද්‍යාව සඳහා අවශ්‍ය දත්ත/තොරතුරු ලබා දීම
4.	පර්යේෂණ පුහුණු හා සංවර්ධන	4.1 පර්යේෂණ අංශය	කාලගුණ විද්‍යා සහ දේශගුණ විද්‍යා පර්යේෂණ පැවැත්වීම
		4.2 පුහුණු අංශය	පුහුණු කිරීම් සහ දෙපාර්තමේන්තු විභාග පැවැත්වීම
		4.3 දේශගුණ වෙනස්වීම් අධ්‍යයන කේන්ද්‍රය	දේශගුණ වෙනස්වීම් වලට අදාල කටයුතු පවත්වාගෙන යාම
5.	පාලන හා මූල්‍ය	5.1 ආයතන අංශය	කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු
		5.2 මූල්‍ය අංශය	මූල්‍ය කටයුතු
		5.3 ප්‍රසම්පාදන අංශය	ප්‍රසම්පාදන, ගබඩා කිරීම්, බෙදාහැරීම්
		5.4 විශේෂ ප්‍රසම්පාදන අංශය	විදේශ වලින් කරන මිලදී ගැනීම්
		5.5 ප්‍රවාහන අංශය	වාහන නඩත්තුව හා ප්‍රවාහන කටයුතු
		5.6 ඉදිකිරීම් අංශය	දෙපාර්තමේන්තුවට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු සම්බන්ධව සම්බන්ධීකරණය

2. කාර්යසාධනය

2.1 කාලගුණ විද්‍යා දත්ත ජාලය

2.1.1. කාලගුණ විද්‍යා නිරීක්ෂණ

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ ජාලයෙන් නිරීක්ෂණය කරන කාලගුණ විද්‍යා දත්ත, භූතල දත්ත හා ඉහල වායුගෝලීය දත්ත වශයෙන් වර්ගීකරණය කල හැක.

2.1.1.1. භූතල නිරීක්ෂණය

2.1.1.1.1. සංක්ෂිප්ත කාලගුණික තොරතුරු

ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල මඟින් පැය 3කට වාරයක් භූතල කාලගුණික දත්ත නිරීක්ෂණය කරනු ලබයි. නිරීක්ෂණය අවසන් වූ වහාම දත්ත කේතනය කිරීමෙන් අනතුරුව ගෝලීය සංඥා පද්ධතිය (GTS) හරහා අන්තර් ජාතිකව විකාශනය සඳහා කොළඹ සංඥා අංශයට දුරකථන මඟින් එවනු ලබයි. තවද කොළඹ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය සහ ගුවන් තොටුපලවල ඇති කාලගුණ විද්‍යා කාර්යාලවල කාලගුණ දත්ත විශ්ලේෂණය සඳහා පාවිච්චි කරයි.

2014 වර්ෂය තුල කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව ඇති දිවයිනේ භූතල නිරීක්ෂණ මධ්‍යස්ථාන ජාලය ඔස්සේ වර්ෂාපතනය, පීඩනය, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සුළඟ, දෘශයතාවය, කාලගුණ තත්වය සහ වලාකුළු වර්ග/ප්‍රමාණය ඇතුළුව භූතල නිරීක්ෂණ 60,813 සිදුකර ඇත .

ඊට අමතරව අමතරව කාලගුණ මධ්‍යස්ථානවල සවිකර ඇති ස්වයංක්‍රිය දත්ත පටිගතවන උපකරණ හරහාත් ප්‍රධාන කාලගුණ පරාමිතීන් නිරීක්ෂණය කරයි. 2014 වර්ෂය තුල වර්ෂාපතන ප්‍රස්ථාර ගණන, උෂ්ණත්ව ප්‍රස්ථාර ගණන, ආර්ද්‍රතා ප්‍රස්ථාර ගණන, පීඩන ප්‍රස්ථාර ගණන සහ හිරු එලිය ලැබෙන පැය ගණන සටහන් වන කාඩ් පත් ගණන පිළිවෙලින් 7090, 7339, 6982, 983, 3121 සහ 175 වේ .

2.1.1.1.2. වර්ෂාපතන දත්ත

වර්ෂාපතන දත්ත ලබාගැනීම සඳහා දිවයින පුරා ස්ථාපනය කර ඇති වර්ෂාමාන ජාලය මධ්‍යස්ථානය 487 කින් සමන්විත වන අතර ඉන් මධ්‍යස්ථාන 410 කින් වසර පුරාම දත්ත ලබා ගනී. මෙම මධ්‍යස්ථාන රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන හා ස්වේච්ඡා නිරීක්ෂකයන්ගේ සහයෝගය ඇතිව පවත්වාගෙන යනු ලැබේ. දිනපතා පැය 8.30ට වර්ෂාපතනය ගණනය කරනු ලබන අතර. මාසය අවසානයේ දෛනික වර්ෂාපතන වාර්තාව දෙපාර්තමේන්තුව වෙත ලබාගනු ලැබේ. දිවයින පුරා පැතිරී යන පරිදි තෝරාගන්නා ලද මධ්‍යස්ථාන 215 ක දත්ත අනාවැකිකරණය සඳහා භාවිතය පිණිස දෛනිකව ලබාගනු ලැබේ. 2014 වසර තුළ නව වර්ෂාමාන මධ්‍යස්ථාන 28 ක් පිහිටුවන

ලද අතර මධ්‍යස්ථාන 28ක පැවති අඩුපාඩු පිළිසකර කරන ලදී. වර්ෂාමාන මධ්‍යස්ථාන 6 ක් නැවත පිහිටුවන ලදි.

2.1.1.1.3. කෘෂිකාලගුණ තොරතුරු

දෙපාර්තමේන්තුව සතුව පවතින කෘෂිකාලගුණ ජාලය, මධ්‍යස්ථාන 35 කින් පමණ සමන්විත වන අතර, සාමාන්‍ය කාලගුණික දත්ත වලට අමතරව මෙම මධ්‍යස්ථාන මගින් කෘෂිකර්මාන්තයට අදාල වන පොළව තුල විවිධ මට්ටම් වල පාංශු උෂ්ණත්වයන්, තෘණ අවම උෂ්ණත්වයන්, වාෂ්පීකරණ සීඝ්‍රතාව-නිරීක්ෂණය කරන අතර, දිනපතා උදේ 0830 සහ සවස 0330 ට නිරීක්ෂණයන් ලබාගනු ලැබේ

කෘෂිකාලගුණ දත්ත වල නිරවද්‍යතාවය සොයා බැලීම සහ එය වැඩිදියුණු කිරීම සඳහා 2014 වසර තුල කෘෂිකාලගුණ මධ්‍යස්ථාන 9 ක් පරීක්ෂා කිරීමට යන ලදි.

කොලඹ කාර්යාලයේ කෘෂිකාලගුණ අංශය මගින් ලබාගන්නා මෙම දත්ත තත්ව පාලනයන්ට යටත්කර, අදාල අංශ වලට ලබා දී 2014 වසර තුල රුපියල් 542,000.00 ආදායමක් දෙපාර්තමේන්තුවට ලැබිණි.

2.1.1.2. ඉහළ වායු ගෝලීය නිරීක්ෂණ

පොළොව මතුපිට සිට ඉහළ වායුගෝලයේ විවිධ උස මට්ටම් වලදී කාළගුණ විද්‍යා පරාමිතීන් පිළිබඳ කරනු ලබන නිරීක්ෂණයන් ඉහළ වායුගෝලීය නිරීක්ෂණයන් වේ. රේඩියෝ සොන්ඩ් උපකරණ භාවිතයෙන් පොළොව මතුපිට සිට කි.මී.20 ක් පමණ උස මට්ටම් වල, ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 0600 ට, සතියට තෙවතාවක් කොළඹදී ඉහළ වායුගෝලීය නිරීක්ෂණ ලබා ගනී. 2015 වසර තුල ලබාගන්නා ලද රේඩියෝ සොන්ඩ් නිරීක්ෂණ ගණන 148 කි. රේඩියෝ සොන්ඩ් නිරීක්ෂණ වලට අමතරව නියාමක බැලූන් (pilot balloon) නිරීක්ෂණ මගින් සුළං පිළිබඳව විස්තර නිරීක්ෂණය කරනු ලබයි.

කොළඹ ට අමතරව මන්නාරම, හම්බන්තොට, හා පොළොන්නරුව යන මධ්‍යස්ථානවලදී නියාමක බැලූන් භාවිතයෙන් සුළං පිළිබඳව විස්තර නිරීක්ෂණය කරනු ලැබේ. කොළඹදී හා ඉහත සඳහන් මධ්‍යස්ථානවලදී පසුගිය වසර තුල කරන ලද බැලූන් නිරීක්ෂණ ගණන පිළිවෙලින් 902, 830, 937, 650 කි.

2.1.2. දත්ත තත්ත්ව පාලනය සහ සංරක්ෂණය

දිවයින පුරා පිහිටි කාළගුණ විද්‍යා මධ්‍යස්ථාන, කෘෂි කාළගුණ විද්‍යා මධ්‍යස්ථාන හා වර්ෂාමාන මධ්‍යස්ථාන වලින් ලැබෙන දත්ත කොළඹ ප්‍රධාන කාර්යාලයේදී තත්ත්ව පරීක්ෂාවට ලක් වන අතර, නිරවද්‍යතාව සැක සහිත විට නැවත විමසා නිවැරදි කිරීමට ලක් කර සංරක්ෂණය කරනු ලබයි.

මෙම දත්ත වල මෘදු පිටපත් සැකසීම හා සංරක්ෂණය Climsoft මෘදුකාංගය ඇසුරෙන් සාර්ථකව සිදු කරන ලදී. ඊට අමතරව, සංරක්ෂණය කල යුතු මුද්‍රිත ලේඛන ඉතා සුරක්ෂිතව සංරක්ෂණය කිරීම සඳහා නවීන පහසුකම් සහිත ලේඛනාගාරයක් 2014 වර්ෂයේදී ස්ථාපනය කරන ලදී.

2.1.3. දත්ත අලෙවි කිරීම

විශ්ව විද්‍යාල සිසුන්, පාසල් සිසුන් හා විවිධ අධ්‍යයනයන් සිදු කරන පුද්ගලයන් හා ආයතනයන් ද, රක්ෂණ සමාගම් සහ ඉදිකිරීම් සමාගම් ද පසුගිය කාලගුණ දත්ත ඉල්ලුම් කරනු ලබන අතර, ඉල්ලුම්කරනු ලබන දත්ත ප්‍රමාණය අනුව දින 01 සිට දින 07 තෙක් කාල පරාසයන් තුළ දත්ත නිකුත් කරනු ලබයි. රාජ්‍ය ආයතන වෙතද විශ්ව විද්‍යාල සිසුන් වෙතද සීමිත මූල්‍ය වටිනාකමක් සහිත දත්ත නොමිලේ සපයන අතර සහතික කළ හා නොකළ දත්ත වශයෙන් නිකුත් කිරීම කරනු ලැබේ.

2014 වර්ෂය තුලදී කාලගුණ තත්ව සවිස්තර වාර්තා 134 ක්, දත්ත වාර්තා 982 ක් බාහිර පාර්ශවයන් සඳහා අලෙවි කොට ඇති අතර දත්ත වාර්තා 95 ක් නොමිලේ සපයා ඇත. 2014 වර්ෂයේදී කාලගුණ තත්ත්ව සවිස්තර වාර්තා සහ දත්ත වාර්තා අලෙවි කිරීමෙන් රු. 5,177,383.00 ක ආදායමක් ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

2.2. මහජනතාවට විවිධ ආයතනයන්ට, විවිධ කර්මාන්තයන්ට අදාල ප්‍රජාවට සහ ලෝක කාළගුණ නිරීක්ෂණ ජාලයන්ට තොරතුරු ලබා දීම.

2.2.1. මහජනතාවට දෛනිකව ලබාදෙන තොරතුරු

දිවයින සඳහා අනාවැකි පෙ.ව. 5.30, ප.ව.12.00, හා ප.ව.4.00 වද අවට මුහුදේ ඉදිරි පැය 24 ඇතුලත පැවතිය හැකි, වැසි, සුළං, අකුණු පිළිබඳ අනාවැකි සෑම දිනකම පෙ.ව. 5.30, මධ්‍යහන 12.00 ට මුද්‍රිත හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඔස්සේ ජාතික කාළගුණ විද්‍යා මධ්‍යස්ථානය විසින් ලබා දෙන ලදී.

වසර පුරා ලබාදෙන ලද දෛනික කාළගුණ අනාවැකි ප්‍රමාණය 1095 වේ. මාධ්‍ය මගින් කරන ලද විමසීම් 4120කට තොරතුරු සපයන ලදී. බහුදින යාත්‍රා සඳහා සපයන ලද අනාවැකි සංඛ්‍යාව 92කි .

දිවයිනෙහි ප්‍රධාන නගර 10 ක කාළගුණ තත්ත්වය සෑම දිනකම ප.ව. 4.00ට මුද්‍රිත, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය මාධ්‍ය වලටද අන්තර්ජාලයටද ලබාදෙනු ලබන අතර වසර පුරා එම වාර්තා 365 ක් නිකුත් කරන ලදී.

2.2.2. **ලෝක නිරීක්ෂණ ජාලයන්ට දත්ත ලබාදීම**

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයෙහි පිහිටි, කාලගුණ විද්‍යා සන්නිවේදන මධ්‍යස්ථානය මගින් පැය තුනකට වරක් ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලින් දත්ත ලබාගෙන ඒවා එසැනින්ම කලාපීය හා ලෝක කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවලට සම්ප්‍රේෂණය කිරීම සඳහා නවදිල්ලියෙහි පිහිටි කලාපීය මධ්‍යස්ථානයට සම්ප්‍රේෂණය කෙරෙයි. මෙම කාර්යය අඛණ්ඩව පසුගිය වසර පුරා සිදුකරන ලදී.

2.2.3. **විවිධ ආයතනයන්ට හා විවිධ කර්මාන්තයන්ට අදාළ ප්‍රජාවට ලබාදෙන තොරතුරු**

ඊට අමතරව පහත සඳහන් විමසීම් වලට 2014 වසරේ දී ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය මඟින්

පොලිසිය ,හෝටල් ,වාණිජ ආයතන මඟින් විමසීම් ,ධීවර ප්‍රජාවගේ විමසීම් ,මාධ්‍ය සඳහා වූ සම්මුඛ සාකච්ඡා සහතික කරන ලද කාලගුණ වාර්තා .

2.3. ගගන කාලගුණ විද්‍යා තොරතුරු ගුවන් සේවා වෙත ලබා දීම සහ නාවුක කාර්යයන් සඳහා සේවා ලබා දීම

2.3.1. **ගගන කාලගුණ විද්‍යා තොරතුරු ගුවන් සේවා වෙත ලබා දීම**

ගුවන් සේවා මෙහෙයුම් වල කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව සහ සන්තතික බව යනාදියට කාලගුණ තත්වය බලපෑම් ඇති කරයි .එම නිසා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කටුනායක ,මත්තල සහ රත්මලාන ගුවන්තොටුපල පරිශ්‍රයන්හි කාලගුණ විද්‍යා කාර්යාල පවත්වා ගනිමින් ගුවන් මෙහෙයුම් වලට බලපාන කාලගුණ තත්වයන් ගැන නිරන්තරයෙන් නිරීක්ෂණය කරනු ලැබේ .

2.3.1.1. කටුනායක ගුවන් තොටුපල

කොළඹ ගුවන් තොරතුරු කලාපය (Colombo FIR) හරහා ගමන් කරන සහ කටුනායක ගුවන් තොටුපල භාවිත කරන ගුවන් යානා සඳහා කටුනායක ගුවන් තොටුපලෙහි කාලගුණ විද්‍යා කාර්යාලය විසින් ලබා දී ඇති TAF වාර්තා ගණන 1460 ක්ද METAR වාර්තා ගණන 17028 ක්ද SIGMET වාර්තා ගණන 154 ක්ද ගුවන් තොටුපලවල අනතුරු ඇඟවීම් (Aerodrome Warnings) ගණන 28 ක්ද වේ. කාලගුණ තොරතුරු අඩංගු ලිපිගොනු ගණන 25,234 , දේශීය ගුවන් ගමන් සඳහා ප්‍රාදේශීය අනාවැකි 5945 කි . මාර්ග අනාවැකි 4678 කි.

2.3.1.2. **මත්තල ගුවන් තොටුපල**

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල එහි කාලගුණ විද්‍යා කාර්යාලය 2014 වසරේ සපයන ලද තොරතුරු පහත ආකාර වේ .

TAF පණිවුඩ 1460, METAR -14384, SPECI - 263

2.3.1.3. **රත්මලාන ගුවන් තොටුපල**

රත්මලාන ගුවන් තොටුපල මගින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර ගුවන් ගමන් මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය වන කාගුණික තොරතුරු සැපයීම හා දෛනිකව අවශ්‍ය කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කිරීම මෙම කාර්යාලයේ ප්‍රධාන වශයෙන් සිදු කෙරිනි . 2014 වසරේ දී සපයන ලද තොරතුරු මෙසේය.

METAR – 4760, SPECI – 347, භූතල මට්ටමේ පීඩනය = 130

2.3.2. **නාවුක කාර්යයන් සඳහා සේවා ලබා දීම**

2.3.2.1. **නාවුක කටයුතු සඳහා දිවයින අවට මුහුදු ප්‍රදේශයේ කාලගුණ වාර්තාව (Shipping Report)**

සෑම දිනකම පෙ.ව. 10.00 ට හා ප.ව. 4.00 ට ශ්‍රී ලංකාව අවට මුහුදේ කාලගුණ තත්වය ලබා දේ. 2014 වසරේදී නිකුත් කර ඇති මුහුදු ප්‍රදේශයේ කාලගුණ වාර්තා ගණන 730 කි.

2.3.2.2. **අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ කාලගුණ වාර්තාව (Fleet Forecast)**

මෙම වාර්තා සෑම දිනකම පෙ.ව. 6.00 ට හා ප.ව. 4.30 ට පහත රූපයේ දක්වා ඇති අන්තර් ජාතික මුහුදු ප්‍රදේශයේ කාලගුණය සුළං සහ මුහුදු තත්ත්වය පිලිබඳ තොරතුරු සහ අනාවැකි ලබාදෙයි . පසුගිය වසරේ නිකුත් කර ඇති වාර්තා ගණන 730 කි.



2.4. සුනාමි හා අයහපත් කාලගුණ තත්ව පිළිබඳව පූර්ව අනතුරු ඇගවම් හා උපදෙස් ලබාදීම

2.4.1. සුනාමි අනතුරු ඇගවීම

ශ්‍රී ලංකාව ආශ්‍රිත ප්‍රදේශවල සුනාමි අනතුරු මෙන්ම භූ කම්පන පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටින කැලිෆෝනීය ඒකාබද්ධ භූ කම්පන ජාලය (CISN), පැසිපික් සුනාමි අනතුරු ඇගවීමේ මධ්‍යස්ථානය (PTWC), ජපන් කාලගුණ විද්‍යා ඒජන්සිය (JMA), සුනාමි තොරතුරු ලබාදෙන කලාපීය සේවා මධ්‍යස්ථානය (RTSP) හා නවදිල්ලි කලාපීය කාර්යාලය යන ආයතනයන්හි සහයෝගය ඇතිව මහජනතාව හා අදාල ආයතනයන් වෙත සුනාමි අනතුරු ඇගවීම් නිකුත් කරනු ලබයි. පසුගිය වසර තුල සුනාමි අනතුරු තත්වයන් ඇති නොවිණි.

2.4.2. අයහපත් කාලගුණ තත්ව නිවේදන

තද වැසි තත්ව, අකුණු, දැඩි සුළං, සුළි කුණාටු හා ටොර්නේඩෝ වැනි කාලගුණ තත්වයන් ඇතිවිය හැකි බව පෙනී යන අවස්ථාවලදී මුද්‍රිත හා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයන් වෙත කඩිනමින් දැනුම්දෙනු ලබන අතර, බලපානු ලබන ප්‍රදේශයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ත්‍රිවිධ හා පොලිස් සංඥා අංශ, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, ධීවර අමාත්‍යාංශය. කලම්බු රේඩියෝ හරහා නාවුක යාත්‍රා වෙත, ජාතික ජලජ සම්පත් පර්යේෂණ ආයතනය, මාස්ටර් ඩයිවර්ස් වෙරළාරක්ෂක අංශය හා බාහිර කාලගුණ විද්‍යා කාර්යාල යන ආයතන සියල්ල වෙත හෝ තත්වය අනුව අවශ්‍ය ආයතන වෙත පැක්ස් හෝ ඊමේල් මගින් දන්වනු ලබයි.

පසුගිය වසර තුල අයහපත් කාලගුණ තත්වයන් පිළිබඳ වාර්තා 78 ක් නිකුත් කර ඇත.

2.5. මහජනතාව දැනුම්වත් කිරිම

2.5.1. මහජනතාව දැනුම්වත් කිරිම වැඩ සටහන්

විශේෂයෙන් කාලගුණ විද්‍යාත්මක ව්‍යසන පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩ සටහන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පවත්වනු ලැබේ.

2.5.1.1. ප්‍රධාන කාර්යාලය නැරඹීම ට පැමිණෙන්නන්

පාසැල් සිසුන්, උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් හා ආරක්ෂක අංශයන්හි නිලධරයන් දෙපාර්තමේන්තුවෙහි කටයුතු පිළිබඳ දැනුම ලබාගැනිම පිණිස නිතිපතා ප්‍රධාන කාර්යාලයට පැමිණෙයි.

කාලගුණ විද්‍යාව, කාලගුණ විද්‍යාත්මක ව්‍යසන සහ දේශගුණ විද්‍යාව පිළිබඳව දේශණ පැවැත්වීමෙන් සහ නිරීක්ෂණ ලබාගන්නා ආකාරය පිළිබඳව අත්දැකීම් ලබාගැනීමට අවස්ථාව ලබාදීම මගින් ඔවුන් දැනුම්වත් කිරිම සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ පැවති දැනුම්වත් කිරීමේ වැඩ සටහන් වලට සහභාගී වූ පාසැල් ශිෂ්‍ය කණ්ඩායම් සහ අනෙකුත් කණ්ඩායම් පිළිබඳ විස්තර පහත අයුරු වේ.

පාසැල් ශිෂ්‍ය කණ්ඩායම් ගණන	300
සිසුන්	31767
උසස් අධ්‍යාපන ආයතන ගණන	09
සිසුන්	802
ආරක්ෂක අංශ සාමාජිකයන් ගණන	729
වෙනත් අය	924

2.5.1.2. දැනුම්වත් කිරීමේ වැඩසටහන්

කාලගුණය , කාලගුණ විද්‍යාත්මක ව්‍යසන, සහ පෙර සූදානම් වීම පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩ සටහන් ප්‍රදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් සංවිධානය කරනු ලැබේ. වසර තුලදී පැවත්වූ දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පිළිබඳ විස්තර පහත අයුරු වේ.

පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්

දිස්ත්‍රික්කය	පවත්වන ලද ස්ථානයන්
මහනුවර	පොලිස් සේවය - සහභාගී වූ ගණන 60 භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය - සහභාගී වූ ගණන 70
අම්පාර	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන් - සහභාගී වූ ගණන 480
රත්නපුර	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන්, පාසල් සිසුන්, ගුරුවරුන් - සහභාගී වූ ගණන 2050
කළුතර	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන් - සහභාගී වූ ගණන 1000
කෑගල්ල	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන්, පාසල් සිසුන්, ගුරුවරුන් - සහභාගී වූ ගණන 1200
පොළොන්නරුව	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන්, පාසල් සිසුන්, ගුරුවරුන්, ව්‍යාපාරිකයන්, යුධ හමුදාව - සහභාගී වූ ගණන 1700
හම්බන්තොට	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන් - සහභාගී වූ ගණන 480
කොළඹ	සර් ජෝන් කොතලාවල විශ්ව විද්‍යාලය ප්‍රාදේශිය ලේකම් කාර්යලය, හෝමාගම – සහභාගී වූ ගණන 150

ගාල්ල	ප්‍රාදේශිය ලේකම් කාර්යලයේ සහ අනෙකුත් රජයේ ආයතනවල නිලධාරීන් - සහභාගී වූ ගණන 750
ත්‍රිකුණාමලය	නාවුක හමුදාව– සහභාගී වූ ගණන 800
පුත්තලම	ප්‍රාදේශිය ලේකම් කාර්යලය, මාදම්පේ – සහභාගී වූ ගණන 70

2.5.1.3. පැවැත්වූ සම්මන්ත්‍රණ/ වැඩ මුළු

2.5.1.3.1. ලෝක කාලගුණ විද්‍යා දිනය

"කාලගුණය, දේශගුණය සහ තාරුණ්‍ය" තේමාව කොටගත් දැනුවත් කිරීම් මාලාවක් යටතේ 2014 කාලගුණ විද්‍යා දිනය වැඩි සහභාගිත්වයක් යටතේ මාර්තු 23 දින උත්කර්ෂවත් අන්දමට පවත්වන ලදි. මෙම වැඩසටහන සඳහා, පාසැල් සිසුන්, නිලධාරීන්, ආයතන මෙන්ම ආරක්ෂක නිලධාරීන් සහභාගී වන ලදි.

2.5.1.3.2. මෝසම් කතිකාවත

මෝසම් කාලය තුළ ඇතිවිය හැකි පාරිසරික තත්වයන් පිළිබඳව නිරිත දිග සහ ඊසාන දිග මෝසම් සුළං ආරම්භ වීමට සති 02කට පමණ පෙර එම තත්වයන් සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතු ආයතනයන් ගෙන්වා පැහැදිලිකිරීම් සිදු කරනු ලබයි. මෙහිදී ගණිතමය ආකෘතියන් වල ප්‍රථිපල සහ වෙනත් අදාළ තොරතුරු ආශ්‍රයෙන්, ඉදිරි මෝසමේදී ඇති විය හැකි කාලගුණ තත්වයන් අනුව සූදානම් වීම සඳහා එම ආයතන සමඟ සාකච්චා කරනු ලැබේ.

2.5.1.4. දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගිත්වය

2014 වසරේ දැයට කිරුළ වැඩ සටහනට දෙපාර්තමේන්තුව සහභාගී විය. මෙහිදී ප්‍රදර්ශනය කරන ලද කාලගුණ විද්‍යා උපකරණ සහ කාලගුණ විද්‍යා නිරීක්ෂණ පිළිබඳව පාසල් සිසුන් අතර විශේෂ උද්‍යෝගයක් පැවතිණි.

2.5.2. **කාලගුණ විද්‍යා උපාංග හා උපකරණ**

කාලගුණ විද්‍යා ඒකක පිහිටුවීම හා දත්ත ලබා ගැනීම පිළිබඳ උපදෙස් ලබා දීම හා පුහුණු කිරීම, විවිධ ආයතන විසින් කාලගුණ විද්‍යා උපකරණ මිළ දී ගැනීමේදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම සිදු කරන ලදී. වර්ෂාමාන මධ්‍යස්ථාන, කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලට අවශ්‍ය උපකරණ ලබා දීම ද සිදු කරන ලදී.

2.5.2.1. උපකරණ අංශය

අලුතෙන් ගොඩ නගන ලද ත්‍රිකුණාමලය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ කාලගුණ විද්‍යා උපකරණ කොටුව ඉදි කරන ලදී. ඊට අමතරව, කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන 08 ක කාලගුණ විද්‍යා උපකරණ අලුත්වැඩියා කරන ලදී. යුධ හමුදාවට සහ වෙළඳ ආයතනයකට අයත් පීඩනමාන 08ක් ක්‍රමාංකනය කරන ලදී. පාසල් ප්‍රදර්ශන 14කට උපකරණ අංශය සහභාගි විය.

2.5.2.2. ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශය

ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික කාලගුණ විද්‍යා උපකරණ අලුත්වැඩියාව සහ නිසි පරිදි පවත්වාගෙන යාමයි. ඊට අමතරව, AWS පද්ධතිය සහ ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය අලුත්වැඩියාව සහ නිසි පරිදි පවත්වාගෙන යාම පසු ගිය වසරේදී ඉතා හොඳින් සිදු කරන ලදි.

2.6. පර්යේෂණ

2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් පර්යේෂන සිදු කරන ලදී.

1. මෝසම් කාලගුණය සමඟ නැගෙනහිර පලාතේ ඇතිවූ ගංවතුර තත්වය පිලිබඳ නිරීක්ෂණය
2. ශ්‍රී ලංකාවේ සහ ඉංදියන් මෝසම් කලාප තුල වලාකුළු වලින් සිදුවන විකිරණයන් සංසන්ධනය කිරීම
3. ලා නිනා පද්ධතිය ශ්‍රී ලංකාවේ වර්ෂාපතනයට ඇතිකරන බලපෑම
4. මහජනතාව පාදක කරගත් අකුණු උපද්‍රව කලාප හඳුනාගැනීම සහ සිතියම් ගත කිරීම
5. සම්මත වර්ෂාපතන දර්ශක භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ඉඩෝර තත්වයන් පිලිබඳ අධ්‍යනය
6. 2000-2030, 2030-2060 සහ 2060-2090 කාල පරිච්ඡේදයන් සඳහා PRECISමෘදුකාංගය භාවිතා කර දේශගුණ පුරෝකථනයන් නිර්මාණය
7. RGUI මෘදුකාංගය භාවිතයෙන් දේශගුණික කලාපකරණීය
8. ශ්‍රී ලංකාවේ දකුණු සහ බස්නාහිර වෙරල බඩ ප්‍රදේශ කරා ලඟා වූ හදිසි බලවත් කුණාටුව පිළිබඳව සමාකරණය
9. 2014. 06. 01 ශ්‍රී ලංකාවට බලපෑ තද වැසි සහ තද සුළං පිලිබඳ WRF සමාකරණය

2.7. තාරකා විද්‍යාව ආශ්‍රිත සීමිත සේවා සැපයීම

සූර්යයා හා චන්ද්‍රයා උදා වීම, බැසීම සිදුවන වේලාවන්, පහන් දල්වන වේලාවන්, තාරකාවන්ගේ දෘශ්‍යතාවය, නව සඳ දැකීම, සඳුගේ කලාවන් ග්‍රහණයන් පිළිබඳ තත්වයන් ගණනය කර අදාළ ආයතන වෙත ලබා දෙන දේ. පොහොය හා රජයේ නිවාඩු දින කමිටුවේ සමාජිකයකු වශයෙන් දෙපාර්තමේන්තුවේ ජ්‍යොෂ්ඨ නිලධරයකුගේ සේවය ලබා දෙන ලදි.

2.8. දෙපාර්තමේන්තු සංවර්ධන කාර්යයන්

2.8.1. සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි

ව්‍යසන අවස්ථාවලදී SOP ඉතා වැදගත් වේ. ඒ හේතුවෙන් අයහපත් කාලගුණ තත්ව වලදී තොරතුරු සන්නිවේදනය කිරිමේදී ඊට අදාළ ආයතනයන්හි නිශ්චිත කාර්ය භාරය පිළිබඳව හා එම සන්නිවේදනය සිදු කරන ආකාරය පිළිබඳ සියලු ආයතන එක්ව එකගතාවයකට එළඹෙන ලදි. ඒ අනුව දෙපාර්තමේන්තුව නිකුත් කරන නිවේදනයන්හි භාවිතා වන තාක්ෂණික යෙදුම් වල ප්‍රායෝගික අර්ථයන් පිළිබඳ සම්මතයන්ද, සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටීන්ද (Standard Operation Procedure) සකස් කරන ලදී.

2.8.2. පැවත් වූ පුහුණු වැඩ සටහන් හා සම්මන්ත්‍රණ

කොරියා අන්තර්ජාතික සහයෝගිතා ආයතනය හරහා කොරියානු රජය විසින් අනුග්‍රාහකත්වය ලබා දෙන ලද ''කාලගුණ විද්‍යා සේවාවාන් සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂනය'' පුහුණු වැඩ මුළුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලද අතර කලාපීය රටවල්වල සහභාගිත්වයෙන් නොවැම්බර් මස 08 - 16 දක්වා කොළඹ දී පැවැත්විනි.

2.9. සහභාගී වූ රැස්වීම්/ පුහුණු/සම්මන්ත්‍රණ /වැඩමුළු

2.9.1. විදේශීය සංචාර (රැස්වීම්/ පුහුණු/සම්මන්ත්‍රණ /වැඩමුළු)

2014 වර්ෂය තුලදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ 35 දෙනෙකු රැස්වීම්/ පුහුණු/සම්මන්ත්‍රණ /වැඩමුළු සහභාගී වීම සඳහා විදෙස් ගත විය.

	නිලධාරියාගේ නම	තනතුර	ශිෂ්‍යත්වයේ නම	පවත්වන ලද රට	ආධාර සපයන ලද රට
1	ජී.කේ. හෙන්දවිතාරණ මිය	කාලගුණ විද්‍යාඥ	කාලගුණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	පිලිපීනය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
2	ඒ.කේ. කරුණානායක මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	නිවර්තන සුළි කුණාටු අනාවැකිකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉන්දියාව	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
3	එල්. චන්ද්‍රපාල මයා	අධ්‍යක්ෂ ජනරාල්	RIMES කාර්ය සාදන බලකායේ රැස්වීම	තායිලන්තය	RIMES
4	ඩී.ඒ.ජේ. වීරවර්ධන මයා	අධ්‍යක්ෂ	නිවර්තන සුළි කුණාටු පිළිබඳ WMO/ESCAP මණ්ඩලයේ 41 වන සැසිවාරය	බංගලාදේශය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
5	එම්.එම්.පී. මෙන්ඩිස් මයා	කාලගුණ විද්‍යාඥ	දුරස්ථ තොරතුරු මගින් මත්ස්‍ය කලාප හඳුනා ගැනීම පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉන්දියාව	ඉන්දියානු සාගර සුනාමි අනතුරු ඇගවීමේ සේවාව / ශ්‍රී ලංකා රජය
6	එල්. චන්ද්‍රපාල මයා	අධ්‍යක්ෂ ජනරාල්	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය 38 වන සමුළුව	ජපානය	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය
7	එස්.ආර්. ජයසේකර මයා	අධ්‍යක්ෂ	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය 39 වන සමුළුව	ජර්මනිය	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය
8	කේ.එච්.එම්.එස්. ප්‍රේමලාල් මයා	අධ්‍යක්ෂ	කාලගුණ විද්‍යා සේවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	කොරියාව	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය
9	පී.එම්. ජයකොඩි මිය	කාලගුණ විද්‍යාඥ	කාලගුණ විද්‍යා සේවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	කොරියාව	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය
10	පී.ජී. යසරත්න මයා	කාලගුණ විද්‍යාඥ	කාලගුණ විද්‍යා සේවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	කොරියාව	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය

11	ජේ.ඩබ්. කරුණාරත්න මයා	කාලගුණ විද්‍යාඥ	කාලගුණ විද්‍යා සේවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය	කොරියාව	කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය
12	ඩී.ඒ. ජයසිංහආරච්චි මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	දීර්ඝ කාලීන අනාවැකිකරණය පිළිබඳ පුහුණු වැඩමුලුව සහ දකුණු ආසියාතික දේශගුණ දර්ශණය පිළිබඳ පස්වන සැසි වාරය (SASCOF-5)	ඉන්දියාව	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
13	එල්. චන්ද්‍රපාල මයා	අධ්‍යක්ෂ ජනරාල්	ඉන්දියන් සාගරයේ දේශගුණ උරුමය ප්‍රතිසාධනය පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුව	මොසැම්බික් රාජ්‍යය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
14	ඒ.ජී.එම්.එම් විමලසූරිය මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	ඉන්දියන් සාගරයේ දේශගුණ උරුමය ප්‍රතිසාධනය පිළිබඳ අන්තර්ජාතික වැඩමුළුව	මොසැම්බික් රාජ්‍යය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
15	පී.එච්.සී. ද සිල්වා මයා	කාලගුණ විද්‍යාඥ	ඍතුමය අනාවැකිකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව	බංගලාදේශය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
16	ඒ.ආර්. වර්ණසූරිය මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	SSOP පුහුණු වැඩමුළුව	චීනය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
17	පී.ඒ.ඒ. ප්‍රියන්ත මයා	කාලගුණ විද්‍යා නිලධාරි	නියග නිරීක්ෂණ සහ පූර්ව අනතුරු පිළිබඳ UNESCAP හැකියා වර්ධන වැඩ මුළුව	ඉන්දියාව	UN ESCAP
18	ඩී.ඩබ්.ටී.ටී. දර්ශිකා මිය	පර්යේෂණ සහකාර	නිවර්තන කලාපීය දූපත් වල දේශගුණ වෙනස්වීම පිළිබඳ වැඩමුළුව	චීනය	ජපාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
19	ඩී.ජී. ප්‍රනාන්දු මිය	කාලගුණ විද්‍යාඥ	වැඩි දියුණු කරන ලද කාලගුණ අනාවැකි සහ දේශගුණ අනාවැකි පිළිබඳ BIMSTEC වැඩ මුළුව	ඉන්දියාව	ශ්‍රී ලංකා රජය / BIMSTEC
20	පී. කරුණාපාල මිය	කාලගුණ විද්‍යාඥ	වැඩි දියුණු කරන ලද කාලගුණ අනාවැකි සහ දේශගුණ අනාවැකි පිළිබඳ BIMSTEC වැඩ මුළුව	ඉන්දියාව	ශ්‍රී ලංකා රජය / BIMSTEC
21	පී.ජී. යසරත්න මයා	කාලගුණ විද්‍යාඥ	කාලගුණ විද්‍යා සේවාවන් බලගතුකිරීම	ජපානය	ජපාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

22	ඒ.එල්.කේ. විජේමාන්න මයා	නියෝජ්‍ය අධ්‍යක්ෂ	Dvorak තාක්ෂනය සහ නිවර්තන සුළි කුනාටු අනාවැකිකරණය පිළිබඳ ජාත්‍යාන්තර වැඩ මුළුව	ඕමානය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
23	කේ.ඩී. සුජීව මයා	කාලගුණ විද්‍යාඥ	Dvorak තාක්ෂනය සහ නිවර්තන සුළි කුනාටු අනාවැකිකරණය පිළිබඳ ජාත්‍යාන්තර වැඩ මුළුව	ඕමානය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
24	ඩී.ඒ.ජේ. වීරවර්ධන මයා	අධ්‍යක්ෂ	12 වැනි පාලක මණ්ඩල රැස්වීම - සාර්ක් කාලගුණික පර්යේෂණ මධ්‍යස්ථානය	බංගලාදේශය	ශ්‍රී ලංකා රජය
25	එම්.ඩී. දයානන්ද මයා	අධ්‍යක්ෂ	දත්ත ප්‍රකෘති තත්වයට පත් කිරීම පිළිබඳව 01 වැනි හැසිරවීමේ රැස්වීම	ස්විස්ටර්ලන්ත ය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
26	එම්.ඩී.එම්.ඩී. කරුණාරත්න මිය	අධ්‍යක්ෂ	ග්‍රාමීය සංවර්ධනය සහ දුගී බව අවම කිරීම	මැලේසියාව	ශ්‍රී ලංකා රජය
27	එල්. චන්ද්‍රපාල මයා	අධ්‍යක්ෂ ජනරාල්	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය 14 වන සමුළුව	ඩෙන්මාකය	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය
28	එස්.ආර්. ජයසේකර මයා	අධ්‍යක්ෂ	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය සමුළුව සහ විද්‍යාත්මක සම්මන්ත්‍රණය	භූතානය	දේශගුණ විපර්යාස පිළබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය
29	ඩබ්.ආර්.එස්. ප්‍රනාන්දු මයා	කාලගුණ විද්‍යා නිලධාරි	උපකරණ ක්‍රමාංකනය සහ නඩත්තු කිරීම	ඉන්දියාව	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
30	අයි.එම්.එස්.පී ජයවර්ධන මෙය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	දේශගුණ සේවාවේ ස්ත්‍රී පුරුෂ භාවය පිලිබඳ සම්මන්ත්‍රණය	ස්විස්ටර්ලන්ත ය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
31	එන්. කුමාරසිංහ මයා	ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු	ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ තොරතුරු පද්ධතිය (WIS) ක්‍රියාත්මක කිරීම	ජපානය	ජපාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ව
32	ටී.එම්.එන්. පීරිස් මයා	කාලගුණ විද්‍යාඥ	ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ තොරතුරු පද්ධතිය (WIS) ක්රියාත්මක කිරීම	ජපානය	ජපාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු ව

33	ඩී.ජී. ප්‍රනාන්දු මිය	කාලගුණ විද්‍යාඥ	දත්ත සමග්‍රහණය කිරීමේ සහ මධ්‍යම ප්‍රමාණයේ අනාවැකිකරන වෘන්දය පිළිබඳ VCP (ස්වේච්ඡා සහයෝගතා වැඩපිළිවෙල) වැඩමුළුව	චීනය	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
34	ඩී.ඒ.ජේ. වීරවර්ධන මයා	අධ්‍යක්ෂ	6 වෙනි කලාපීය සම්මන්ත්‍රණය - කලාප 2	දෝහා-කටාර්	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය
35	අයි.එම්.එස්.පී ජයවර්ධන මෙය	නියෝජ්‍ය අධ්‍යක්ෂ	නිවර්තන සුළිකුණාටු පිළිබඳ 8 වැනි අන්තර්ජාතික වැඩමුළුව සහ සුළිකුණාටු ගොඩබිමට ඇතුල්වීමේ ක්‍රියාවලිය පිළිබඳ 3 වන අන්තර්ජාතික වැඩමුළුව	කොරියාව	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය

2.9.2. **දේශීය පුහුණු**

වර්ෂය තුලදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ 48 දෙනෙකු, විවිධ ආයතනවල පුහුණු වන ලදී. ඊට අමතරව , දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ශ්‍රී ලංකා තාක්ෂණික සේවයේ නිලධාරීන් 97දෙනෙකුගේ සහභාගිත්වයෙන් , සන්තත අධ්‍යාපන සහ පුහුණු වැඩ සටහන (CET) පවත්වන ලදී. කාලගුණ විද්‍යා සහායක 55 දෙනෙකු සඳහා මූලික පුහුණුව ලබාදෙන ලදී .

3. පාලන හා මූල්‍ය අංශයේ කාර්ය සාධනය

3.1. පාලන අංශය

2014.12.31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 460ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 331ක් විය.

වර්ෂ අවසානය වන විට කාලගුණ විද්‍යා නිලධාරි/නිරීක්ෂක/සන්නිවේදක තනතුරු 39 ක්ද, ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරි තනතුරු 22 ක්ද, කාලගුණ විද්‍යා සහායක තනතුරු 14 ක්ද, රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 13 ක්ද පුරප්පාඩු වී තිබුණි.

3.1.1. **බඳවා ගැනීම්/පුරප්පාඩු සම්පූර්ණ කිරීම**

2014 වර්ෂය තුළ පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරන ලදී.

තනතුර	**පුරප්පාඩු සංඛ්‍යාව**
කාලගුණ විද්‍යාඥ (ශ්‍රී.ලං.වි.සේ.)	08
රාජ්‍ය කළමනාකරණ සහකාර	08
රියදුරු	02
කාලගුණ විද්‍යා සහායක	09

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ අභ්‍යන්තර විගණක අංශයේ අභ්‍යන්තර විගණක ලෙස යූ.පී. විජයහේවා මිය වැඩ බැලීමේ රාජකාරි සඳහා 2014 වර්ෂයේදී පත්කරන ලදී.

3.1.2. විශ්‍රාම ගැන්වීම /සේවයෙන් ඉවත් වීම/මුදා හැරීම/තනතුර අතහැර යාම/මිය යාම

දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු වල සේවය කරන ලද නිලධාරින් 09 දෙනෙකු 2014 වර්ෂයේ විශ්‍රාම ගනු ලැබූ අතර 05 දෙනෙකු සේවයෙන් ඉවත් වූ අතර 05 දෙනෙකු වෙනත් සේවා සඳහා යාමට සේවයෙන් මුදා හරින ලදී. තවද 02 දෙනෙකු තනතුර අතහැර ගියා සේ සලකන ලදී.එමෙන්ම නිලධාරින් 02 දෙදෙනෙකුගේ මරණ 2014 වර්ෂයේ සිදු විය.

3.1.3. විශ්‍රාමික නිලධාරින් නැවත සේවයේ යෙදවීම

පසුගිය වර්ෂ 05 ඇතුළත විශ්‍රාම ගිය නිලධාරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම 2014 වර්ෂයේ දී සිදුවිය.

3.1.4. අදාළ කාර්යක්සමතා කඩඉම් පරීක්ෂණ සහ දෙපාර්තමේන්තු පරීක්ෂණ පැවැත්වීම

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විභාග අංශය හා සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ හා තාක්ෂණික සේවයේ නිලධාරින් සඳහා පැවැත්විය යුතු පළමු හා දෙවන දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණද, කාලගුන විද්‍යා සහායක තනතුර සඳහා වන පළමු හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ප්‍රතිඵලද නිකුත් කිරීමටද 2014 වර්ෂයේදී හැකිවිය.

3.1.5. ගර්හිත භාණ්ඩ වෙන්දේසිය

2014 වර්ෂය ආරම්භයේ සිදු කරන ලැබූ භාණ්ඩ සමීක්ෂණයේදී ගර්හිත කරනු ලැබූ භාණ්ඩ 2014 වර්ෂයේ අගෝස්තු මස සිදු කරන ලදී.ඉන් ලද ආදායම රු.38,660.00 ක මුදල රජයේ ආදායමට බැර කිරීමට දෙපාර්තමේන්තුවට හැකිවිය.

3.1.6. ඉදි කිරීම් කටයුතු

නුවර එළිය සංචාරක බංගලා බාරකරුගේ නිල නිවස ඉදිකිරීම් කටයුතු බොහෝ දුරට අවසන් කර ඇත. මේ වන විට තීන්ත ආලේපය හා වැසිකිළියේ උපාංග සවිකිරීමේ කටයුතු පමණක් ඉතිරිව ඇත. ත්‍රිකුණාමලය කාලගුණ විද්‍යා කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර මේ වන විට බොහෝ කටයුතු ආරම්භ කර ඇති අතර මේවන විට බොහෝ කටයුතු අවසන් කර ගැනීමට හැකිවිය. 2015 මැද භාගය වන විට මෙහි කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

3.2. මූල්‍ය අංශය

3.2.1 ආදායම්

2014 අපේක්ෂිත සහ සැබෑ අදායම් ගිණුම

ශීර්ෂය - 304 **වැඩසටහන - 02** **ව්‍යාපෘති අංක 01**

ආදායම් සංකේතය	විස්තරය	2014 ආදායම		විස්තරය
		ඇස්තමේන්තුව රු:	සත්‍ය රු:	
20.02.01.01	රජයේ වත්කම් වලින් ලැබෙන රජයේ ගොඩනැගිලි කුලී	550,000	413,342	අධ්‍යක්ෂ ජනරාල් නිල නිවාසයේ සහ බාහිර කාර්යාල යන්හි කාර්ය භාර නිලධාරීන් සඳහා වන නිලනිවාසයන්හි කුලිය.
20.02.01.99	රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම - අනෙකුත් කුලී	12,600	11,900	අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂකවරුන් 02 සඳහා ලබාදි ඇති වාහන සඳහා වන කුලිය
20.02.02.99	පොලිය - වෙනත්	1,600,000	1,259,673	පොලිය - රජයේ සේවකයන් සඳහා වන අත්තිකාරම් 'බී' ගිණුම
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනමය ගාස්තු - විවිධ	6,500,000	6,447,235	විවිධ ක්ෂේත්‍රයන් සඳහා දත්ත හා වාර්තා නිකුත් කිරීම මගින් ලැබෙන ආදායම - උදා:- විශ්ව විද්‍යාල , කොන්ත්‍රාත්කරුවන් ආදීන් සඳහා
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	500,000	1,266,311	පාසල් නිරීක්ෂණ, පාසල් සඳහා වාර්තා නිකුත් කිරීම, ටෙන්ඩර් ලියාපදිංචි කිරීමේ ගාස්තු, දේශන හා වැඩමුළු පැවැත්වීම, ශ්‍රවනාගාරය වෙන්කරවා ගැනීම, පොත්පත් විකිණීම හා නුවරඑළිය සංචාරක බංගලාව වෙන් කර ගැනීම මගින්.
එකතුව		**9,162,600**	**9,398,461**	

2014 ප්‍රතිපාදන - පුනරාවර්තන වියදම් (රු)

ශීර්ෂය - 304 | **වැඩසටහන - 02** | **ව්‍යාපෘති අංක 01**

කාණ්ඩය	ව්‍යාපෘතිය - 01		%	විස්තරය
	ප්‍රතිපාදන රු.	වියදම රු.		
පුද්ගල පඩිනඩි	**146,850,000**	**146,792,223**	**100**	වැටුප් හා වේතන. අතිකාල හා නිවාඩු දින වැටුප් සහ වෙනත් දීමනා
වෙනත් පුනරාවර්තන	**59,880,000**	**59,744,121**	**100**	
ගමන් වියදම්	1,410,000	1,378,619	**98**	දේශීය ගමන් වියදම් විදේශීය ගමන් වියදම් - විදේශීය රැස්වීම් හා සම්මන්ත්‍රණ
සැපයීම්	10,430,000	10,426,920	**100**	කාලගුණ විද්‍යා බැලූන්. රේඩියෝසොන්ඩ්, සන්ෂයින් කාඩ්, ලිපිද්‍රව්‍ය හා කාර්යාලයිය අවශ්‍යතා මිලදී ගැනිම ඉන්ධන හා ලිහිසි තෙල්, ආහාරපාන හා නිලඇඳුම්
නඩත්තු වියදම්	5,413,000	5,409,416	**100**	වාහන. යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ හා ගොඩනැගිලි නඩත්තු වියදම්
සේවා	34,394,330	34,300,196	**100**	ප්‍රවාහන සේවා, තැපැල් හා විදුලි සංදේශ සේවා, විදුලිය හා ජලය, වරිපණම් හා බදුකුලි, ආරක්ෂක හා පවිත්‍රතා සේවා සහ වෙනත් සේවා සඳහා වන වියදම්
මාරු කිරීම	8,232,670	8,228,970	**100**	ලෝක කාලගුණ විද්‍යා සංවිධානය හා වෙනත් විදේශීය සංවිධාන 3 ක් සඳහා ගෙවිය යුතු දායක මුදල් සහ රජයේ සේවකයන්ගේ දේපළ ණය පොළී
මුළු වියදම	**206,730,000**	**206,536,344**	**100**	

2014 ප්‍රතිපාදන - මූලධන වියදම් (රු.)

ශීර්ෂය - 304 **වැඩසටහන - 02** **ව්‍යාපෘති අංක 01**

වැය විෂය සංකේතය	වැය විෂය විස්තරය	2014 ශුද්ධ ප්‍රතිපාදන රු :	2014 වියදම රු :	%	විස්තරය
	එකතුව (ව්‍යාපෘතිය 01)	**83,795,000**	**72,909,032**	**87**	
ව්‍යාපෘතිය 01	කාලගුණ විද්‍යා සේවා				
	එකතුව	**83,795,000**	**72,909,032**	**87**	
	පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	**5,600,000**	**5,599,397**	**100**	
2001	ගොඩනැගිලි හා ඉදිකිරීම්	5,600,000	5,599,397		ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම - රු. මි. 4.58 අධ්‍යක්ෂ ජනරාල් නිලනිවස, රත්නපුර කාලගුණ විද්‍යා කාර්යාලය හා අනෙකුත් කාර්යාල වල අළුත්වැඩියා කටයුතු
	මූලධන වත්කම් අත්පත් කරගැනීම	**38,487,783**	**28,470,131**	**74**	
2101	වාහන	90,000	89,910	**100**	මහඉලුප්පල්ලම, පුත්තලම, ත්‍රිකුණාමලය, හම්බන්තොට, පොතුවිල් හා මඩකලපුව කාලගුණ විද්‍යා කාර්යාලයන්ට බයිසිකල් 6 ක් මිලදී ගැනීම
2102	ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ	13,000,000	12,999,986	**100**	
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	6,302,304	6,300,630	**100**	කාලගුණ විද්‍යා උපකරණ (දේ.අ.) - රු. 4,998,325.80 කාලගුණ විද්‍යා උපකරණ (වි.ආ.ප්‍ර.) - රු. 1,302,304.00

2104	ගොඩනැගිලි හා ඉදිකිරීම්	17,095,479	7,093,993	**41**	යාපනය, නුවරඑළිය හා ත්‍රිකුණාමලය කාලගුණ විද්‍යා කාර්යාලයන්හි නව ඉදිකිරීම්
2105	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	2,000,000	1,985,612	**99**	කොළඹ ප්‍රධාන කාර්යාලයෙහි භූමි අලංකරණ කටයුතු හා අනෙකුත් ඉඩම් වැඩිදියුණු කිරීම් කටයුතු
	හැකියා වර්ධනය	**2,205,000**	**2,192,275**	**99**	
2401	කාර්ය මණ්ඩල පුහුණු	2,205,000	2,192,275	**99**	මාණ්ඩලික නිලධාරීන්, තාක්ෂණික හා තාක්ෂණික නොවන නිලධාරීන් සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්
	වෙනත් මූලධන වියදම්	**37,502,217**	**36,647,229**	**98**	
2502	ආයෝජන	37,502,217	36,647,229	**98**	දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා - රු. 1,502,216.06 ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය - රු. 35,145,013.17

<u>අත්තිකාරම් ගිණුම් සාරාංශය - 2014</u>

ශීර්ෂය - 304 **වැඩසටහන - 02** **ව්‍යාපෘති අංක 01**

අයිතමය	2014 ඇස්තමේන්තු රු :	2014 සත්‍ය රු :
රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම		
වියදමෙහි උපරිම සීමා	10,000,000	7,148,261
ලැබීම් වල අවම සීමා	5,500,000	8,299,327
හර ශේෂයන්ගේ උපරිම සීමා	60,000,000	30,574,147

4.කෘතඥතාව

විවිධ ව්‍යාපෘති, වැඩ සටහන් සහ රැස්වීම්වලදී , අප ආයතනයට සහයෝගය දැක්වූ සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලයන්ට මාගේ කෘතඥතාවය පළ කරමි. තවද, කාලගුණ තොරතුරු සාමාන්‍ය ජනතාව වෙත ගෙනයාමේ දී ජනමාධ්‍ය විසින් සිදු කරන ලද සේවය වෙනුවෙන් මාගේ ස්තූතිය පල කර සිටිමි. අවසාන වශයෙන්, අප්‍රමාදී සහයෝගයෙන් සහ අවංකව සේවය සැලසීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ සියළුම සේවක සේවිකාවන්ට මාගේ කෘතඥතාවය පලකරමි.

ලලිත් චන්ද්‍රපාල ,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.